# රාමායණ කෘතියෙහි ඇති ඓතිහාසික වටිනාකම

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මිකා කුමාරි මනතුංග,**

**ආචාර්ය වී.ඩී.එන්.එස්.ගුණවර්ධන**

---

රාමායණය හා මහාභාරතය පෙරදිග සාහිත්‍යයෙහි වීරකාව්‍ය ලෙස හැඳින්වේ. මෙම කෘතීන් දෙක ගත් කල විශ්ව සාහිත්‍ය ක්ෂේත්‍රයේ අමරණීය ස්ථානයක් ගෙන තිබේ. රාමායණ කෘතිය බාල කාණ්ඩය, අයෝධ්‍යා කාණ්ඩය, අරණ්‍ය කාණ්ඩය, කිෂ්කින්ධා කාණ්ඩය, සුන්දර කාණ්ඩය, යුද්ධ කාණ්ඩය හා උත්තර කාණ්ඩය ලෙස කාණ්ඩ හතකින් සමන්විතවේ. මෙය ශ්ලෝක 24000කින් සමන්විත දීර්ඝ කෘතියකි. රාමායණයෙහි විස්තරවන පරිදි සියලුම ගීතයන්ගේ ශ්‍රේෂ්ඨ ගීතය මෙය වන අතර මෙය කියවීම තුලින් ආයුෂ හා සම්පත්තිය ලඟාකර දෙතැයි සඳහන්වේ (රාමායණ 1999: 27) මෙම ලිපිය සම්පාදනයේදී අප විසින් ප්‍රධාන වශයෙන් පරිහරණය කරනු ලැබුයේ ජී. එස්. බී. සේනානායක මහතා විසින් පරිවර්තනය කරන ලද රාමායණ කෘතියයි.

වර්තමාන ඉතිහාසඥයන් බොහෝ දෙනෙක් රාමායණය ඓතිහාසික කෘතියක් ලෙස සැලකීමට මැලිවන අතර ඊට හේතුව ලෙස මෙම අධ්‍යයනයේ දී අපහට පෙනීගියේ රාමායණය තුල අන්තර්ගත අභව්‍ය යැයි සැලකෙන සිදුවීම් රාශිය යැයි පෙන්වා දිය හැකිය. ක්‍රි. පු. 4 වන සියවසේ දී පමණ රචනා වුයේ යැයි සැලකෙන රාමායණය කල්පිත සිදුවීම් රාශියකින් සමන්විත වේ. රාමායණයෙහි අඩංගු කථාපුවත ක්‍රි:පු: 2432-2375 අතර කාලයේදී සිදුවන්නට ඇතැයි ආනන්ද ගුරුගේ මහතා ප්‍රකාශ කරයි (ඔයැ ඝ්ජ්හ්බ් එදදන ච්කජු 1844 හැ්රි ඉැදෙරු එයැ ර්මාාය් ැබඑ්රුා දබ යසි පසිසදබල එය්එ සි ිදපැඅයැරු ඉැඑඇැබ 2432 ර්ගක ්බා 2375 ර්ගකඝ* (ගුරුගේ 1991: 35). නමුත් රාමස්වාමි ශාස්ත්‍රී මෙය ක්‍රි:පු: 5000 හා 6000 අතරට ගණන් බලා ඇත (ගුරුගේ 1991: 35).

නමුත් ඉතිහාසය ගොඩනැගීමේදී ඉතිහාසඥයන් විසින් මහාභාරතය, පුරාණ ග්‍රන්ථ, වේද ග්‍රන්ථයන්හි කරුණු උපකාර කරගන්නේ නම් රාමායණය එක හෙළා ප්‍රතික්ෂේප කරනුයේ මන්ද යන්න අප තුළ ඇති ගැටලුවකි. මූලාශ්‍රයෝ වනාහි ඉතිහාසකරණයේදී ඉවහල් කරගනු ලබන මූලයෝය. එකී මූලයන්ගෙන් සර්වාකාරයෙන් පිරිපුන් නූතන ඉතිහාස දෘෂ්ටියට අනුරූප ඓතිහාසික තොරතුරු බලාපොරොත්තු වීම කළ නොහැක්කකි (බණ්ඩාර 2012: 278).

රාමායණය කිසියම් ජනප්‍රවාදයක් පදනම් කොට ගෙන රචනා වන්නට ඇතැයි අප තුළ කුතුහලයක් පවතී. එසේ නොවුයේ නම් රාමායණ කථා පුවත මේතාක් දුරට මිනිස් හදවත් තුළට කිඳා නොබසිනු ඇත.

මෙම ලිපිය සැකසීමට මත්තේන අප විසින් රාවණා කථා ප්‍රවෘත්තියට අදාළ යැයි ජනප්‍රවාදයේ පවතින රාවණා ඇල්ල, රාවණා රජමහා විහාරය, රාවණා ගුහාව, දිවුරුම්පොළ විහාරය, ස්ත්‍රීපුර කන්ද, බොලතුඹේ දේවාලය, සීතාඑළිය, රූමස්සල, ලකේගල, ස්ත්‍රීපුරකන්ද, සීගිරිය හා පිදුරංගල යන ස්ථානවලට පමණක් නොව ඉන්දියාවේ සේදුපදී, රාමේශ්වරම, විභීෂණ අභිෂේක කළ ස්ථානය යැයි ප්‍රසිද්ධියක් උසුලන කොථණ්ඩරාමාර් කෝවිල අවට ප්‍රදේශවලද සංචාරය කරන ලදි.

එසේම රාමායණයට අදාළ කැටයම් දක්නට ලැබෙන එළිෆන්ටා ගුහා හා එල්ලෝරා ගුහා පිහිටි ස්ථානයන්හි ද සංචාරය කරන ලදි.

## ඉතිහාසය ගොඩනැගීමට උපකාරීවන පුවත්

මහාවංසයට අනුව විජය කුමරු ලාට දේශයෙන් පිටුවල් කරනුයේ ඔහුගේ හිතුවක්කාර ක්‍රියා නිසාය (මහාවංසය 1950 6. 39). මේ පුවත සිහිගන්වන සිදුවීමක් රාමායණය තුළ ද දක්නට ලැබේ. අයෝධ්‍යාවෙහි සාගර නම් රජෙකුවිය. මොහු විදර්භ රජුගේ දියණිය වූ කේශිනී සිය අග මෙහෙසිය කරගන්නාලදි. අරිෂ්ටනේමි රජුගේ සුමති නම් දියණිය දෙවන මෙහෙසිය කර ගන්නා ලදි. දරුවන් නොමැතිකම නිසා හිමවත් ප්‍රදේශයේ වසර සියයක් පමණ තපස් රැකීම නිසා භෘගු නම් ඍෂිවරයා මොහුට වරයක් ලබා දේ. මෙම වරයේ ප්‍රතිඵලයක් ලෙස කේශිනී බිසවට වංශය පවත්වාගෙන යන්නා වූ අසමඤ්ජ නම් පුතා ලැබෙන අතර සුමති බිසවට පුතුන් 60,000 ක් ලැබේ. වැඩිමහලු පුතා සෙසු කුමාරවරුන් සරයු නදිය වෙත ගෙන ගොස් ඔවුන් දියේ දමා ගිලෙන මතුවෙන හැටි බලමින් විනෝද වූ අතර මොහුගේ හිංසාකාරී ක්‍රියාවන් හේතුවෙන් මොහු රටෙන් පිටුවහල් කරන ලදි (රාමායණ 1999: 79-80). මේ අනුව, එකල පැවති සිරිතක් ලෙස හිංසාකාරී ක්‍රියාවන්හි නිරතවන රජ පවුල්වලට අයත් කුමාරවරුන් රටෙන් පිටුවහල් කළ බව පෙන්වාදිය හැකිය.

අතීතයේදී ත්‍රිකුණාමල ප්‍රදේශය හඳුන්වන ලදුයේ ගොකණ්ණ යනුවෙනි. එමෙන්ම මහවැලි ගඟ හඳුන්වන ලදුයේ මහාගංගා යනුවෙනි. බොහෝ විට මෙම ස්ථාන නාම ව්‍යවහාරයන් ඉන්දියාවේ නැගෙනහිර ආර්යාවර්තයේ සිට පැමිණි ආර්ය ජන කණ්ඩායම් හේතුවන් අති වූ බව සිතිය හැකිය. ගංගා නම් ගංගේ මුවදොර අසල ගෝකර්ණ යනුවෙන් ස්ථානයක් වූ බවත් එම ස්ථානයට තපස් රැකීම සඳහා පිරිස් ගමන් ගත් බවට සාධක රාමායණය අනුව පෙනේ. ආර්. ඒ. බ්‍රෝහියර් ද තාම්‍රලිප්ත වරාය හා ගෝකණ්ණ වරාය අතර පැවති සබඳතාවය සඳහන් කොට ඇත (1935: 12). දිලීප රජුගේ පුත් භාගීරථ බලයට පත්වී ඔහුට ගඞ්ගාව දෙව්ලොවින් පෘථිවිය කරා ගෙන්වා ගනු කැමතිව මන්ත්‍රීවරුන්ට රාජ්‍යය පවරා ගෝකර්ණයට ගොස් තපස් රැකීමෙහි නියැළුණු බව දක්වා ඇත (රාමායණ 1999: 85-86). රාවණ ද ගෝකර්ණාශ්‍රමය වෙත ගොස් තවුස් දම්පිරූ බව සඳහන්වේ (රාමායණ 2001: 215). ඉන්දියාවේ ආර්ය ජනපද බිහිවූ ගංගානම් ගඟ අසල (බස්නායක 2004: 47-49) පිහිටියා යැයි සැලකෙන ගෝකණ්ණයෙහි සිට පැමිණි පිරිස් ලංකාවේ මහවැලි ගඟ අසබඩ පදිංචි වී මහවැලි ගගේ මුවදොර හැඳින්වීම සඳහා ගෝකණ්ණ යන නම භාවිත කළ බව පෙනේ.

මියගිය දශරථ රජුගේ සිරුර ඇමතිවරු විසින් තෙල් පිරවූ දෙණක තබා චාරිත්‍ර පැවැත් වූ බව රාමායණයෙහි දැක්වේ (රාමායණ 1999: 287-288). මෙම තෙල් පිරවූ දෙණ යනුවෙන් අදහස් කරන ලද්දේ කුමක්ද යන්න මෙහිදී විමසිය යුතුය. ඇතැම් විට ලංකාවේ පැවතියා බඳු වූ බෙහෙත් ඔරුවක් ද යන්න මෙහිදී ඇතිවන ගැටලුවකි. ලංකාවේ පැරණි රෝහල්වල දක්නට ලැබෙන බෙහෙත් ඔරු පිළිබඳව මෙතෙක් කරන ලද පර්යේෂණවලදී හෙළි වී ඇත්තේ එය ලංකාවට පමණක් ආවේණික වූවක් බවය.

විරාධ නම් තැනැත්තා රාම හා ලක්ෂමණ විසින් මහ වළක දමා ගල්පතුරු බහා වල වසන ලදි. මෙසේ ගල්පතුරු වසා මිනී වැලලීමේ සම්ප්‍රදාය මෙගලිතික සුසාන භූමිවලද දැකිය හැකිය

(රාමායණ 1999: 388). රාවණ විසින් හනුමන් ඝාතනය කිරීමට නියම කරයි. මේ අවස්ථාවේදී විභීෂණ ප්‍රකාශ කරනුයේ නීතිය දන්නා යහපත් රජුන් කිසි කලෙකත් දූතයෙකු නැසීම නොකළ යුතු බවය. දූතයෙකුට දිය යුතු දඬුවම වනුයේ සිරුර විරූප කිරීම, කසයෙන් තැලීම, හිසමුඩු කිරීම, හංවඩු ගැසීම ආදිය බවය. විභීෂණ විස්තර කරන ආකාරයට අතීතයේ පැවති දඬුවම් ක්‍රම පිළිබඳව යම් අවබෝධයක් මේ තුලින් ලබාගත හැකිය. තාටකා ස්ත්‍රියක් නිසා, නොමැරිය යුතු යැයි සිතූ රාම ඇයගේ අත් දෙක කපා දැමුවේය. ලක්ෂමණ කන් දෙක හා නාසය කපා දමන ලදි (රාමායණ 1999: 61) ලංකාවේ වේවැල්කැටිය, කොණ්ඩවටවන සෙල්ලිපිවල ඇතුලත් දඬුවම්වලට සමාන දඬුවම් ක්‍රම ඉන්දියාවේ ද පැවති බවට මෙය කදිම නිදසුනකි (අමරවංශහිමි 2014: 239, 285).

## රාමායණෙහි අඩංගු උපදේශයන්

බාලකාණ්ඩයේ ප්‍රථම සර්ගය අවසානයෙහි රාමායණය කියවීමෙන් ලැබෙන ප්‍රයෝජන දක්වා ඇත (රාමායණ 1999: 15). එහි සඳහන් ආකාරයට රාමායණය නැමති ආඛ්‍යානය යම් මිනිසකු කියවයි නම් ඔහු ද, ඔහුගේ දරුමුණුබුරෝ ද ස්වර්ගයෙහි ඉපදෙන්නාහුය. බ්‍රාහ්මණයකු මෙය කියවා නම් හේ වාගීෂ වෙයි. ක්ෂත්‍රියයෙකු කියවා නම් හෙතෙම පෘථුවියෙහි ආධිපත්‍යයට පැමිණෙයි. වෛශ්‍යයෙකු කියවයි නම් ඔහුගේ වෙළහෙළදාම් වැඩි දියුණු වෙයි. ශුද්‍රයෙකු කියවයි නම් හේ මහත්මාභාවට පැමිණේ යැයි දක්වා ඇත.

කෙනෙකු තුළ ඉවසීම වර්ධනය කළ යුතු ආකාරය පිළිබඳව ද යම් අවබෝධයක් රාමායණය තුළින් ගත හැකිය. වර්තමාන අර්බුද බොහොමයකට හේතු වී ඇත්තේ ද ඉවසීමේ ගුණාංගය නොමැතිකමය. කුශනාභගේ දියණියන් සමග විවාහ වීමට වායු යෝජනාවක් ගෙන ආ මොහොතේදී දියණිවරු ප්‍රකාශකරනුයේ තම පියා කැමති අයෙකු හා විවාහ වීමට අභිමත බවය. මෙය ඇසූ වායු, දියණියන් සියලු දෙනාම විකෘති කරනලදි. මෙය දුටු කුශනාභ දියණින් අමතා ප්‍රකාශ කරන්නේ ඉවසීම පුරුදු කරන ලෙසය. ඔහු සිය දියණියන්ට මෙසේ ප්‍රකාශ කරයි.

ඹමම ඉවසීම පුරුදු කිරීමෙන් මාගේ කුලය රැකගතිමි. ගැහැණියකුට හෝ පිරිමියකුට ඉවසීම අලංකාරයකි.-------ඉවසීම දානය ය. ඉවසීම සත්‍ය ය. ඉවසීම යාගය ය. ඉවසීම කීර්තිය ය. ඉවසීම ධර්මය ය. ලොව පිහිටා තිබෙන්නේ ඉවසිම මතය, (රාමායණ 1999: 72).

රජෙකු නොමැතිව රට අරාජිකවන ආකාරය ද මෙහි විස්තර වේ. මෙහි දී ඹදිය සිඳුණු ගඟ යම් බඳු ද, තුරුලියෙන් තොර වූ වනය යම් බඳු ද, ගොපල්ලා නැති ගව රංචුව යම්බඳු ද, රජෙකු නැති රට ද එබඳුය, යනුවෙන් දක්වා ඇත (රාමායණ 1999: 289).

සීතා විසින් රාමට රකුසන් මැරීම හා ආයුධ දැරීම සම්බන්ධව දෙන අවවාදයන්හි මෙසේ ද ප්‍රකාශ කරයි. ධර්මයෙන් අර්ථය ලැබෙන බවත්, ධර්මයෙන් සුවය ලැබෙන බවත් හා ධර්මයෙන් සියල්ලම ලැබෙන බවත් දක්වයි (රාමායණ 1999: 398). ධාර්මිකව ජීවත්වීමේ වටිනාකම මෙහිදී විස්තර කරයි.

අඞගද, හනුමන් ඇතුලු වානර පිරිස මුහුද අභියසට පැමිණි ආකාරය විස්තර කිරීමේදී කිපුණ සර්පයෙකු දරුවා විනාශකරන්නාක් මෙන් කලකිරීම පුරුෂයා විනාශකර දමන බව දක්වා ඇත

(රාමායණ 2000: 202). බිරිඳට සැමියා වූ කලී උසස්ම ආභරණය වේ. ඒ සැමියා නැමති ආභරණින් තොරවූ ඇය නොබබළන බව විස්තර කොට ඇත (රාමායණ 2000: 245).

රාවණාගේ සොහොයුරෙකු වන විභීෂණ පර අඹුවන් පරිහරණය කිරීම අපකීර්තිය, අල්පායුෂය, අර්ථ හානිය ගෙන දෙන මහා පාපයක් බව රාවණට ප්‍රකාශ කරයි (රාමායණ 2000: 360). එසේම තවත් විටෙක විභීෂණ ප්‍රකාශ කරනුයේ ආයුෂ කාලය, ගෙවී ගිය ඇත්තෝ කාලය විපරීත වී ඇති හෙයින් හිතවාදී අවවාද නොපිළිගන්නා බවය (රාමායණ 2000: 371). අවවාදයන්හි පිහිටීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කර ඇත. අකම්පන ඝාතනය විස්තර කිරීමේදි බලවතා ඇසුරු කරන දුබලයා ද බලවත්වන බව ලෝක ධර්මය බව දක්වා ඇත (රාමායණ 2001: 36).

බලවතුන්ගේ බලවතා පවා යම් කලෙක අවඥාවට පත්වන බවත් එහෙයින් තමන්ට හිත කැමති කිසිවෙකු විසින් හෝ අනුන්ට ගර්හා නොකළ යුතු බව දක්වා ඇත (රාමායණ 2001: 269).

පුද්ගලයා යම්ක්‍රියාවක් නොකලකිරීමෙන් අරඹද්ද, එය ඒකාන්තයෙන්ම සඵලවන බව විස්තර කොට ඇත (රාමායණ 2000: 236). බිරිඳට සැමියා වූ කලී උසස්ම ආභරණය වේ. ඒ සැමියා නමැති ආභරණින් තොරවූ ඇය නොබබළන බව හනුමන් කල්පනා කිරීම විස්තර වේ.(රාමායණ 2000: 236).

අන් ස්වාමියෙකු සතු භාර්යාවක් රැගෙන ඒම නිසා එදින පටන් රටපුරා අසුබ නිමිති පහළ වෙමින් පවතින බව විභීෂණ ප්‍රකාශ කරයි. එම අසුබ නිමිති නම් දෙනුන්ගේ කිරි සිඳී ඇති බවත්, ඇත්තු විමදව වෙසෙන බවත්, අශ්වයෝ කැමෙන් තොරව හේෂාරවයකරන බවත්, හැළුණු ලොම් ඇතිව බටළුවෝ නිදන බවත්, පක්ෂීහු ක්‍රෑර වී ඔබ මොබ පියඹන බවත්, සිවල්ලු රංචු ගැසී නගරයෙහි තැනින් තැන සිටින බවත්ය (රාමායණ 2000: 361). බෞද්ධ සම්ප්‍රදායෙහිද රජු අධාර්මික වූ විට රට වැසියා පීඩාවට පත්වූ අවස්ථාවන් පිළිබඳව දක්නට ලැබේ.

## උත්පත්ති කථා

### ශ්ලෝකය යන්න බිහි වූ ආකාරය

දිනක් වාල්මිකී ශිෂ්‍යයන් සමග ජාහ්නවී ගංගාවේ තමසා තොටුපොළට පැමිණි අතර එහිදී ජලස්නානය කිරීමට කැමති වන වාල්මිකී තොටුපොළට බසින අතරතුර වනයේ අසිරිය නරඹන්නට විය. මෙහිදී මිහිරි නාදයෙන් කෙළිදෙලෙන් පසුවන කොස්වා ලිහිණි යුවළක් ඔහුට දක්නට ලැබිණි. එකිනෙකාගෙන් වෙන්නොවී සිටින මේ දෙදෙනාගේ පිරිමි පක්ෂියාට වැද්දන් විසින් හීයක් විදින ලදි. ලේ තැවරුණු පක්ෂියා බිම වැටුණු අතර පක්ෂි ධේනුව විලාප දෙන්නට විය. මෙය දුටු වාල්මිකී ශ්ලෝකයක ස්වරූපයෙන් මෙසේ ප්‍රකාශ කරන ලදි. ඍනිෂාදය, කාමක්‍රීඩාවෙහි නියැළී සිටි ලිහිණියා විද මරා දැමූ තොපට කිසි කලෙකත් පිහිටක් නොලැබේවා, මෙය ඇසූ වාල්මිකීගේ ශිෂ්‍යයා වන භාරද්වාජ එය මිහිරි ශ්ලෝකයක් බව ප්‍රකාශ කරනලදි. සම අක්ෂරවලින් හා පාද සතරකින් සමන්විත වූ මේ ගීතය ශෝකය මුල් කරගෙන ඇති වූ හෙයින් ශ්ලෝක බවට පැමිණියේය යනුවෙන් මෙහි ශ්ලෝක යන පදය උත්පත්තිය ලද ආකාරය දක්වා ඇත (රාමායණ 1999: 21-24).

**රාමගේ උපත**

බොහෝ කාලයක් රකින ලද දැඩි තපෝ ව්‍රතයක් හේතුකොටගෙන රාවණා විසින් මහාබ්‍රහ්මයාගෙන් දේව, ගාන්ධර්වයන් හට රාවණ ඝාතනය කිරීමට නොහැකි වන ලෙස වරයක් ලබාගන්නා ලදි. මෙහිදී රාවණ ඝාතනය කළ හැක්කේ මිනිසකුට බව මහාබ්‍රහ්මයා ප්‍රකාශ කරයි. මේ හේතුවෙන් ඍෂීන් විසින් විෂ්ණු දෙවියන්හට මිනිස්ලොව ඉපදෙන ලෙස ආරාධනා කරන අතර ඔහු දශරථ රජතුමාගේ පීතෘත්‍වයට කැමතිවිය (රාමායණ 1999: 44).

**කන්දර්පගේ උපත**

විශ්වාමිත්‍ර, රාම හා ලක්ෂ්මණට සුරයු නදිය හා ගඞගා ගඟ එකතුවන ස්ථානයෙහි පිහිටි අවුරුදු දහස් ගණනක් පැරණි අසපුවක් හමුවේ. එය කවරක් දැයි කුමරුවන් ප්‍රශ්න කළ විට විශ්වාමිත්‍ර ප්‍රකාශ කරනුයේ කලකට පෙර කාම නමින් හඳුන්වනු ලැබූ කන්දර්ප තපෝව්‍රතයක යෙදී සිටි, ඊශ්වර දෙවියන්ට මල් හීයක් විදිමෙන් කිපුණු ඊශ්වරයාගේ තුන්වන ඇසින් නික්මුණු ගින්නෙන් කන්දර්ප දැවී ගිය බවත් මෙයින් අශරීරවත් බවට පැමිණි කන්දර්ප ඉන් පසු අනඞග නමින් හඳුන්වනු ලැබූ බවත් රාමායණයෙහි දැක්වේ.

**සාගරයේ උපත**

රාමායණයට අනුව සාගරගේ මුණුබුරා ශංකර නම් වේ. සාගර රජු යාගයක් පවත්වන අතර තුර ඉන්ද්‍රයා රාක්‍ෂසියකගේ වේශයෙන් පැමිණ යාගාශ්වයා පැහැර ගනී. මෙයින් කිපුණු රජු, සාගරගේ පුතුන් 60,000 කැඳවා අශ්වයා සොයාගෙන එන ලෙස පිටත්කරන ලදි. පොළෝ තලයෙහි ද මුහුදෙහි ද අශ්වයා සොයාගැනීමට නොහැකිව ඔවුන් විදුරවි වැනි වූ නියපොතුවලින් පොළොව හාරන්නට විය. මෙහි දී පොළොව කැගසන්නට වූ අතර අන්තිමේ දී මොවුන් රසාතලය ද බිඳ දමනලදි. මෙය දැකීමෙන් බියට පත් වූ නාගයන් ද, අසුරයන් ද, රාක්ෂසයන් ද පීතාමහා රජු වෙත ගොස් සත්‍වයාගේ විනාශය ගෙන දෙන ඉහත ක්‍රියාව ගැන දැනුම් දෙන ලදි (රාමායණ 1999: 80).

යාග අශ්වයා සොය ගත නොහැකි වූ සාගරගේ පුතුන් තම පියා වෙත ඒ බව දැනුම් දෙන ලදි. පියා නැවතත් කිහිප පොළකින් පොළොව හාරන ලෙස දැනුම් දුනි. මෙසේ නැවත පොළොව හැරීමේ දී ඔවුන්ට පොළොව දරා සිටින්නා වූ විරූපාක්ෂ නම් දිශා බාර හස්තිරාජයා දක්නට ලැබුණි. හිමාලය මුල ප්‍රදේශය හාරන විට කපිල ඍෂිවරයා සමීපයෙහි යාගාශ්වයා සිටිනු දැක කපිල ඍෂිවරයාට සාගරගේ පුතුන් බැණ වැදුණු අවස්ථාවේ දී කපිල ඍෂි ඔවුන් සියලු දෙනාම පුළුස්සා අලුකරන ලදි (රාමායණ 1999: 82). සාගරගේ පුතුන් යාග අශ්වයා සොයමින් හාරණ ලද පොළොවේ කුහරවල ජලය පිරීම හේතුවෙන් සාගර යන නම බිහිවූ බව රාමායණයෙහි දැක්වේ.

මින්පසු සාගර රජු සිය පියවරුන් සොයාගෙන එන ලෙස අංශුමා නම් තම මුණුබුරා දුන්න හා කඩුව අතැතිව පිටත් කර හරී. තම පියවරුන් විසින් හාරා ඇති පෘථිවි කුහර හරහා ගමන් ගන්නා ඔහුට ද දිගැතා හමුවේ. පියවරුන් අලුකරවන ලද ස්ථානය ද හමු වූ අතර යාගාශ්වයා ද හමුවේ. සුපර්ණ නම් ගරුඬ රාජයා ඔහුට මුණ ගැසෙන අතර හිමාලයේ ජ්‍යෝෂ්ඨ දියණිය ගඞගා, කපිල

ඍෂිගේ ක්‍රෝධයෙන් පිලිස්සීගිය සිය පියවරුන්ගේ අලුමත ජලය ඉසින ලෙසත්, ඉන් අනතුරුව ඔවුන් ස්වර්ගයට නගින බවත් ප්‍රකාශ කරන ලදි. අශ්වයා ලබාගන්නා අංශුමාන් සාගර වෙත ගෙන ගොස් යාගය සම්පූර්ණ කරයි (රාමායණ 1999: 83).

අංශුමාන් රජකමට පත් වූ අතර ඔහුගෙන් පසු දිලීප බලටය පත් වේ. ඔහුගේ පුත් භාගීරථ බලයට පත්වුණ අතර ඔහුට ගඞගාව දෙව්ලොවින් පෘථුවිය කරා ගෙන්වා ගනු කැමතිව මන්ත්‍රීවරුන්ට රාජ්‍යය පවරා ගෝකර්ණයට ගොස් තපස් රැකීමෙහි නියැලුණේය. මේ තපස නිසා පැහැදුණු පිතාමහ රජ ඔහුට කැමති වරයක් ඉල්ලන ලෙස පැවසීය. එහිදී ඔහු මියගිය සාගරගේ පුතුන්ට ජලශුද්ධිය සඳහා ගඞගාවගේ ජලය ලබා දෙන ලෙස ඉල්ල සිටී (රාමායණ 1999: 85). මේ අවස්ථාව සනිටුහන් කරන එනම් ගංගාව පොළොවට වැටෙනු පෙන්නුම් කරන කැටයම් ඉන්දියාවේ ජනප්‍රිය කැටයමක් වේ. ශිව ගංගාධර අවස්ථාව නිරූපණය කරන කැටයම ලෙස මේවා නම් කරනු ලැබේ.

### අමෘතයෙහි උපත

දිති හා අදිති යන දෙදෙනාගේ බලවත් වූ පුතුන්ට රෝග පීඩාවලින් තොරව අජර අමර වීමට අවශ්‍ය විය. ඔවුන් මහමේරු පර්වතය උගුලාගෙන ඒ වටා වාසුකී නාගරාජය රැහනක් මෙන් පටලවාගෙන කිරි මුහුද කලඹන්නට විය. මෙසේ අවුරුදු දහසක් ගත වූ විට වසුකීට වෙහෙස දැනී ඔහුගේ දත්වලින් පර්වතය විකන්නට වූ අතර මතුවූ හලාහල විෂ හේතුවෙන් සමස්ත ලෝකය දැවෙන්නට විය. විෂ්ණු ද දණ්ඩක් ගෙන කිරි මුහුද කලඹන කල ආයුර්වේදයේ කර්තෘ ධන්වන්තරී එක අතකින් දණ්ඩකුත් අනෙක් අතින් කොණ්ඩියත් රැගෙන මුහුදෙන් මතුවිය. ඉන්පසු දෙවඟනෝ මතුවිය. මුහුදට අධිපති වරුණගේ භාර්යාව වූ වාරුණී පහළ විය. උච්චෛශ්‍රවස් නැමති අශ්වයා ද කෞස්තුභ නැමති මාණික්‍ය රත්නය ද අමෘතයද පහළ විය (රාමායණ 1999: 89).

### පල්ලවයන්ගේ උපත

විශ්වාමිත්‍ර පල්ලවයන් විනාශ කරනු දුටු බාමධේනුව ශකයන් හා යවනයන් මැවූ බවත් කාමධේනුවගේ විලාපයෙන් කාම්බෝජයෝ ජනිත විය. ඇයගේ තණපුඩුවලින් වැද්දෝ උපන්හ. යෝනියෙන් යවනයෝ ද, අධෝමාර්ගයෙන් ශකයන් ද, රෝමකූපවලින් ම්ලේඡ හාරීත හා කිරාතයෝ උපදිනි  යැයි රාමායණයෙහි දැක්වේ (රාමායණ 1999: 102).

### සීතාගේ උපත

රාවණ දිනක් හිමවතෙහි ඇවිදින කල වේදවතී නම් වූ තාපස කන්‍යාවක් දක්නට ලැබිණ. රාවණ ඇය කෙරෙහි සිත පහදවාගත් අතර වේදවතිය ඔහුව ප්‍රතික්ෂේප කරයි. රාවණ වේදවතීගේ කෙස්වැටිය අල්වා ගත් අතර ඇය රාවණගේ ස්පර්ශයෙන් කෝපවී සිය කෙස්වැටිය කපා දමා රාවණ බලා සිටියදීම ගින්නට පනින ලදි. නැවත ඇය පද්මයක් මත කන්‍යාවියක්වී උපත ලැබුවාය. රාක්ෂසය ඇය අල්වාගෙන තම ඇමතියන්ට පෙන්වීය. ඇය සිය නිවස තුල තබාගත හොත්

ඇයගෙන්ම රාවණගේ මරණ සිදුවන බව ඇමතියන් ප්‍රකාශ කිරීම නිසා ඇය ගෙන ගොස් මුහුදට දැමීය. අනතුරුව ගොඩබිමට පැමිණි ඇය යාගයක් පවත්වමින් සිටි ජනක රජුගේ නගුලෙහි ගැටී සීතා නමින් ප්‍රකට වුවාය. කෘතයුගයේදී ඇය වේදවතී නම් විය. ත්‍රේතා යුගයේදී ඇය රාක්ෂසයාගේ වධය පිණිස නැවත උපන් බව මෙහි විස්තර කරයි (රාමායණ 2001: 231)

**පුත්‍ර යන පදයේ උත්පත්තිය**

හැම ආකාරයකින්ම පියා රැකගන්නා වූ පුතා විසින් පුං නැමති නරකයට යාමට ඉඩ නොදී පියා රැකගතයුතු හෙයින් පුතාට පුත්‍ර යන නම ලැබුණ බව දක්වයි (රාමායණ 2000: 361).

**හනුමන්ගේ උපත**

දිනක් හනුමන් හිරු අල්වා ගැනීමට ගිය අතර එදිනම රාහු ද හිරු අල්වාගෙන ගිල දැමීමට බලාපොරොත්තු විය. හනුමන් හිරුගේ රියමුදුන අල්වාගත් පසු එයට බිය වී රාහු ඉන්ද්‍ර භවනයට යන ලදි. මේ බව දැනගත් ඉන්ද්‍රයා සිය ඓරාවණ ඇතා පිට නැගී රාහු පෙරටු කොට පැමිණි අතර රාහු දුටු හනුමන් ඒ හිරුගේ අනෙක් පලයකැයි සිතා රාහු අල්වා ගැනීමට ඔහු වෙත පනින ලදි. රාහු බිය වී කැගසා ඉන්ද්‍රගේ ආරක්ෂාව පතන ලදි. අනතුරුව ඓරාවණ හස්තියා දුටු හනුමන් එම හස්තියා හිරුගේ අනෙක් පලයකැයි සිතා ඇතා අල්වා ගැනීමට හස්තියා වෙත පනින ලදි. මෙසේ හස්තියා අල්ලාගැනීමට සමීපවත්ම ඉන්ද්‍ර විසින් හනුමන්ට වජ්‍රායුධය දමා ගසන ලදි. එය වැදී හනුමන් ගේ හනු ඇටයක් කැඩිණ. ඉන්ද්‍ර කෙරෙහි කෝප වූ හනුමන්ගේ පියා වන වායු සිය පුතා ඉන්ද්‍රගේ ප්‍රහාරය හේතුවෙන් කඳුමුඳුනින් වැටෙනු දැක සිය පුතා ඔසවාගෙන ගොස් ගුහාවකට වී විසූ බවත් වායු ගුහාවට වී විසීම හේතුවෙන් සකල සත්ව වර්ගායටම ආශ්වාස ප්‍රශ්වාස රහිතව මහත් පීඩාවක් වූ බව මෙහි සඳහන් වේ (රාමායණ 2000: 397).

අගස්ති ඍෂිවරයා පුලස්ත්‍යගේ කතාව ගෙන හැර දක්වයි. පුලස්ථ්‍ය වූකලි ප්‍රජාපතීගේ පුතෙකු වේ. මොහු මහා මේරු පර්වතයේ පසක පිහිටි තෘණවින්ද ආශ්‍රමයෙහි තපෝචරණයෙහි යෙදී සිටි කල්හි නිතර නිතර කන්‍යාවෝ ඒ ප්‍රදේශයට පැමිණියෝය. තමන්ගේ තපසට බාධාවන නිසා පුලස්ථ්‍ය යම් කන්‍යාවක් තමන් හමුවට පැමිණෙන්නීද ඇය ගැබ්ගනීවා යනුවෙන් පාර්ථනා කරන ලදි. තෘණවින්දු රාජර්ෂියාගේ දියණිය මේ ප්‍රදේශයට පැමිණි අතර ඇය ගැබ් ගත්තාය. තෘණවින්දු දියණිය රැගෙන මුනිවරයා වෙතට ගිය අවස්ථාවේදී මුනිවරයා දියණිය බාරගන්නා ලදි. මෙහිදී පුලස්ත්‍ය ඍෂි ප්‍රකාශ කරනුයේ එම කන්‍යාවට පුත්‍ර රත්නයක් ලබා දෙන බවත් ඔහු පෞලස්ත්‍ය නම් වන බවත් කන්‍යාවියට වේදය කියාදෙන කල්හි ඔහු එය අසාගෙන සිටි හේතුවෙන් විශ්‍රවා යනුවෙන් ප්‍රසිද්ධවන බවත්ය (රාමායණ 2001: 198).

ප්‍රජාපතී ජලය මැවූ බවත් ජලය ආරක්ෂා කරනු පිණිස සත්වයන් මැවූ බවත් පසුව ක්ෂුත්පිපාසයෙන් පෙළුණු සත්වයෝ ප්‍රජාපතී වෙත ගොස් දැන් අපි කුමක් කරමුදැයි විමසූ අවස්ථාවේදී ඔවුන්ගෙන් එකෙක් රක්ෂාම යනුවෙන් ද, අනෙකෙක් යක්ෂාම යනුවෙන්ද ප්‍රකාශ කළ අතර රක්ෂාම යනුවෙන් කී තැනැත්තා රාක්ෂසයෙක්ද, යක්ෂමා යනුවෙන් කී තැනැත්තා යක්ෂයෙක්ද වේවා යැයි පැවසූ බව මෙහි විස්තර වේ (රාමායණ 2001: 202).

සුමාලි නම් රාක්ෂස තෙමේ සිය දියණිය වන කෛකසීට විශ්‍රවස් මුනිවරාය අපේක්ෂා කරන ලෙස උපදෙස් දෙයි. තම පියාගේ උපදෙස් පරිදි කෛකසී විශ්‍රවස් මුනිවරයා වෙත යන අතර දරුණු වේලාවක පැමිණීම හේතුවෙන් ඇයට රකුස් පුතුන් ලැබෙන බව මුනිවරයා ප්‍රකාශ කරයි. මෙහි ප්‍රතිඵල ලෙස අතිශය බිහිසුණු දශග්‍රීව (රාවණ) ද, කුම්භකරණ ද, විභීෂණ ද ලැබේ. දිනක් තම පියා දකිනු කැමතිව කුවේර පුෂ්පක රියෙන් පැමිණෙන අතර වෛශ්‍රවණ දුටු කෛකසී දශග්‍රීව අමතා තෙදසින් බබළන සොහොයුරා වැන්නකු වන ලෙස උපදෙස් දෙයි. මෙහිදී මැණියෙන්ට පසු තැවිලි නොවන ලෙසත් තමන් අතිශය දුෂ්කරවූ තපස් දම් රැකීම සඳහා ගෝකර්ණාශ්‍රමය වෙත යන බවත් ප්‍රකාශ කරයි (රාමායණ 2001: 215).

### රාවණාදීන්ට වරදීම

රාවණ දරුණු තපසෙහි යෙදෙමින් වසර දහසකට එක හිස බැගින් අග්නිට පූජා කරමින් අවුරුදු නවදහසක් ගත කරන ලදි. දසවන හිස කැපීමට සූදනම් වෙත්ම පිතාමහ ඔහු ඉදිරියට පැමිණ තමන් කැමති වරයක් ඉල්ලන ලෙස ප්‍රකාශ කරයි. මෙහිදී රාවණ තමන්ට අමරණීයත්වය ඉල්ලා සිටී. අමරණීයත්වය ලබාදිය නොහැකි බව පිතාමහ ප්‍රකාශ කළ අවස්ථාවේදී නාග, යක්ෂ රාක්ෂ, දේව යන කිසිවෙකුටත් තමන් මැරීමට නොහැකිවන ලෙස වරයක් දෙන මෙන්ද තණපතක් තරම් වටිනාකමක් නොමැති හෙයින් ඊට මනුෂ්‍යයන් එකතු නොකරන ලෙසත් රාවණ ප්‍රකාශ කරයි. මීට අමතරව පිතාමහ තමන් විසින් ගින්නට පුද කළ හිස් නවය නැවත රාවණට ලබාදීමට ද කැමති වේශයකින් කැමති තැනකට යාමට බලයක්ද ලබාදෙයි. විභීෂණගේ ද තපස පිළිබඳව පැහැදී ඔහු විසින් ඉල්ලා සිටින ධාර්මිකත්වය නොනැසී පවතීවා යනුවෙන් ද වරයක් ලබාදෙයි. කුම්භකර්ණයා විසින් තමන්ට අවුරුදු ගණනක් නිදාගැනීමට හැකිවන ලෙස වරයක් ඉල්ලා සිටී.

### රාවණාදීන්ගේ විවාහය

දෙසොහොහුරන් සිය නැගණිය වන ශූපර්ණකා කාලකේය විද්‍යුත්ජිහ්වට විවාහ කරදෙයි. රාවණ දිනක් මුවදඩයමෙහි යන විට දිතිගේ පුතෙකු වූ මය හමුවේ. මය හේමා නැමති අප්සරාව විවාහ කරගත් බවත් ඇය දේවකාරියක් සඳහා මීට වසර දහහතරකට පෙර පිටවගිය බවත් තමන් ඇයගෙන් උපන් මන්දෝදරීව රැකබලාගෙන සිටින බවත් මෙහිදී ප්‍රකාශ කරයි. මය සිය දියණිය රාක්ෂාසයාට විවාහ කරදීමට කැමති වේ. ශෛලූෂගේ දියණිය කුම්භකර්ණ විවාහකර ගන්නා අතර විභීෂණ සරමා නැමති යුවතිය විවාහ කරගනී. මන්දෝදරියට මේඝනාද නම් පුත්‍රයා ලැබිණ. ඉන්ද්‍රජිත් නමින් ප්‍රකට වුයේ මොහුය.

### රාවණ යන නම ලැබීම

කුවේර ජයගෙන පුෂ්පකරථයෙන් ගමන් ගන්නා රාවණ ගිරිශිඛරයක් මත පුෂ්පක රථය නවත්වා හාත්පස බැලූ අතර හිමිකරුගෙන් තොරවූ නිසා පුෂ්පකරථය සෙලවීමට නොහැකි විය. මේ අවස්ථාවට ශිව දෙවියන්ගේ සහචරයෙකු වූ විකට පෙනීමක් ඇති නන්දි නැමති වාමනයා එතැනට

පැමිණේ. ශිව ක්‍රීඩා කරන බවත් කිසිවෙකුටත් එහි යා නොහැකි බව ඔහු ප්‍රකාශ කරයි. නන්දි දෙස බලා වඳුරෙකුට සමාන කරමින් අවඥා සහගත වචන ප්‍රකාශ කොට රාවණ ඒ අණ නොතකා ශිව දෙවියන් සිටින ප්‍රදේශයට ගමන් කරයි. මෙහිදී නන්දි විසින් රාවණට ශාප කරයි. ඒ කෙසේද යත් මා වඳුරෙකුට සමාන කොට අවඥා කිරීම නිසා මා හා සමාන බලයෙන් හා රූපයෙන් යුක්ත වානරයෝ තගේ වධය පිණිස උපදින ලෙසත් වානරයෝ තාගේ ඇමතියන් හා පුතුන්ද වනසන බවටත් ශාපකරයි. තමන්ගේ පුෂ්පකයෙහි ගමන නැවතුණ නිසා රාවණ මේ කන්ද මුලින්ම උපුටා දමන බවට ප්‍රකාශ කරමින් දෑත පර්වතය වටා යවා දැඩි ලෙස අල්වාගෙන සෙලෙව්වේය. එයින් භීතියට පත්වූ පාර්වතිය ඊශ්වර වැලඳගන්නා ලදි. ගණසමූහයා ද කම්පාවට පත්විය. මේ අවස්ථාවේදී මහදෙවියා සිය පයෙහි අගිල්ලකින් රාවණගේ අත මැඩීය. මෙහිදී යක්ෂයන් විසින් රාවණට මහදෙවියා පහදාවාගන්නා ලෙස ඉල්ලා සිටී. මෙයින් සතුටට පත්වූ මහදෙවියා සිය පය බුරුල් කල අතර පර්වතය සොළවන ලද අවස්ථාවේදී භයානක රාවයක් නිකුත් වූ හෙයින් මුළු තුන්ලොවම හඬමින් බියපත්වූ නිසා අද සිට රාවණ ලෙස නම් කරන බව සඳහන්වේ. (රාමායණ 2001ඃ 228).

### දශරථ රජු විසින් සිදුකරනු ලැබූ අශ්වමේධ යාගය

ආර්ය ඇදහිලිවලට කේන්ද්‍රය වුයේ යාගය හෙවත් හෝමයයි (බෂාම් 1995ඃ 310). අතීතයේ පැවති අශ්වමේධ යාගයෙහි ස්වරූපය පිළිබඳව යම් අවබෝධයක් රාමායණයෙන් ලබාගත හැකිවේ. සරයු ගඞගාවෙහි උතුරු ඉවුරෙහි යාග භූමිය ඉදිකරන ලද අතර (රාමායණ 1999ඃ 39). වසරක් මුදාහරිණු ලැබූ අශ්වයා පෙරළා සුරයු නදී තීරයට පැමිණිය යුතුවිය.  නුවර ආහාර ශාලා විවිධ වර්ගයේ කෑම බීමවලින් පිරී ඉතිරී ගිය අතර ඒ ඒ දෙවිවරුන්ට අදාළ සත්‍වයන් ඔවුන් වෙනුවෙන් කැප කළහ. උරග, පක්ෂි, ජලචර ආදී සතුන් ද කැප කරන ලදි. සතුන් 300 ක් යාග කණුවල බඳින ලදි. කෞසල්‍යා බිසොව යාගාශ්වයා ප්‍රදක්ෂිණාකර ඇය ඌ සමඟ රැයක් ගතකොට පසුදින අශ්වයා යාගස්ථම්භයේ බඳිනු ලැබීය. ප්‍රථමයෙන් යාග කණුවෙහි බැඳතිබූ අශ්වයාගේ අතුණුබහන් උපුටාගෙන එක් බමුණෙක් ඒවා පිසින ලදි. රජතුමා ඒ ධූමගන්ධය ආඝ්‍රාණය කළේය. අනතුරුව බමුණෝ 16 දෙනෙක් අශ්වයාගේ කොටස් උපුටාගෙන ගින්නට දැමූහ. අශ්වමේධ යාගයෙන් පසුව රාම කුමාරයා කෞසල්‍යාගේ කුසින් බිහිවූ අතර භරත කුමාරයා කෛකෙයී බිසවගෙන්ද, සුමිත්‍රා බිසවගෙන් ලක්ෂමණ හා ශත්‍රුඝ්න යන කුමාරවරුන් ද බිහිවිය (රාමායණ 1999ඃ 49).

### කෞශාම්බි, මහෝදය හා ගිරිව්‍රජ නගර නිර්මාණය

කුශ නම් බ්‍රාහ්මණයාට සිය බිරිඳවන වෛදර්භීගෙන් කුශාම්බ, කුශනාභ, අසූර්තරජස් හා වසු යනුවෙන් පුතුන් හතරදෙනෙක් ලැබීය. කුශාම්බ තෙමේ කෞශාම්බි නගරය නිර්මාණය කරන ලදි. කුශනාභ මහෝදය නගරය නිර්මාණය කරන ලදි. අසූර්තරජස් ධර්මාරණ්‍යය ද, වසුතෙමේ ගිරිව්‍රජය ද ඉදිකරන බව දැක්වේ (රාමායණ 1999ඃ 70).

**උමා-ගඞගා ප්‍රවෘත්තිය**

හිමාලය නම් පර්වත රාජයාට මේනා නම් භාර්යාවක් විය. ඔවුන්ට උමා හා ගංගා නමින් දියණියන් දෙදෙනක් විය. සියලු දෙවිවරු එක්වී හිමාලයාගේ දෙටු දියණිය තමන්ට විවාහ කරදෙන ලෙස ඉල්ලා සිටින ලද නිසා ගංගාව දෙවිවරුන්ට විවාහ කර දෙන ලදි. අනෙක් දියණිය වන උමා උග්‍ර තපස් දම් ආරක්ෂා කළ අතර ඇය රුද්‍රට විවාහ කර දෙන ලදි. ලෝකයාගේ නමස්කාරයට පාත්‍ර වූ මේ ගංගා හා උමා යන දෙදෙනා හේතු කොටගෙන හිමාලය හා මේනා නිතරම සොම්නසින් සිටිති යැයි මෙහි දැක්වේ. ගංගාව ගැබ්බරව සිටි අවස්ථාවේ දී ඇයගේ ගැබ හිමාලය පාමුල තබන ලෙස අග්නි උපදෙස් ලබාදේ. ගංගා තොමෝ ගැබ එහි තැන්පත් කළ විට මුලු පර්වතයම රන්වන් වූ බව ත් ඉන් විවිධ ලෝහ වර්ග ජනිත විය. එතැන් පටන් රන්වලට ජාතරූප යන නම ලැබූ බව රාමායණයෙහි සඳහන්වේ (රාමායණ 1999: 77).

**ශක්‍ර-අහල්‍යා ශාපය**

ගෞතම ඍෂි හා ඔහුගේ බිරිඳ වන අහල්‍යා තපස් රැකීමේ නිරතව සිටි අතර ශචී දෙවඟනගේ සැමියා වූ ඉන්ද්‍ර තවුස් වෙස් ගෙන එහි පැමිණ අහල්‍යා සමඟ සමහම් සුවය විඳීය. ඉන්ද්‍ර නිවසින් පිටවත්ම ගෞතම ඍෂි පැමිණි අතර ඔහු ඒ බව වටහා ගෙන ඉන්ද්‍රට හා අහල්‍යාට ශාප කරයි. ඉන්ද්‍රට කරන ලද ශාපයෙන් ඔහුගේ අණ්ඩකෝෂ දෙක බිම වැටිණ. අහල්‍යාට කරන ලද ශාපය හේතුවෙන් කිසිවකුටත් දැකීමට නොහැකිවන පරිදි අසපුව තුල අහල්‍යා සිටිය යුතුවිය. කිසියම් දිනක දශරථ රජුගේ පුත් රාම එහි පැමිණියේද එයින් ඇයගේ ශාපය නැතිවන බව ප්‍රකාශ කරන ලදි (රාමායණ 1999: 94). දෙවිවරු පීතෘ දේවතාවන්ට ගොස් ඉන්ද්‍රට වූ කරදරය දැනුම් දුන් අවස්ථාවේ දී ඔහුට බැටළුවෙකුගේ මුෂ්ක ද්වයය සවිකරගන්නා ලෙස දැනුම් දී ඇත.

**අභිෂේකය**

රාමගේ අභිෂේකය සඳහා සූදානම් කර තිබූ භාණ්ඩවල විස්තරයක් මෙහි දක්වා ඇත. මෙහි දී අභිෂේකය සඳහා යොදා ගෙන ඇත්තේ ගඞගා ජලයෙන් පිරුණු පුන්කළස්, මුහුදෙන් සොයාගත් මැණික්, උදුම්බරාමය භද්‍රපීඨය, සියලු වර්ගවල ධාන්‍ය, සුවඳ වර්ග, රන්රුවන්, කිරි, දී, ගිතෙල්, විලඳ, කුසතණ, මානස විලේ ජලය, පියකරු කාන්තාවන් අටදෙනෙක්, මැතැතුන්, අසුන් සිවුදෙනෙකු යෙදූ මඞගල රථය, මඞගල දුන්න, මිනිස් රිය, පුන්සඳු බඳු කුඩය, සුදු සෙමෙර, රන් කෙණ්ඩිය, රන්දම් පළන් මඞගල වෘෂභයා, සිවුදළ ඇති සිංහ ධේනුව, ව්‍යාඝ්‍රානුකාරී සිංහාසනය, යාගදර, යාගාග්නිය, වාදක වෘන්දය, වෛශ්‍යාවන්, සව් අබරණින් සැදුම්ලත් කාන්තාවන්, ඇදුරු බමුණන්, ගවයන්, වාසනාවන්ත මුව පක්ෂීන්, දෙටු පුරවැසියන් (රාමායණ 1999: 173) යනාදිය වේ. අශෝක අධිරාජයා විසින් දේවානම්පියතිස්ස රජුට ලබාදෙන ලද අභිෂේකෝපකරණ පිළිබඳව මහාවසංයේ මෙසේ දැක්වේ. වල් විදුනාය, නලල් පටය, මඟුල් කඩුව, සේසත, මිරිවැඩි සඟල, ඉස් වෙළුම, කර්ණාභරණය, පාමඟ (රන් දම්වැල) ය, (දැවමුවා) කෙණ්ඩිය, රත් සඳුන්ය, නොසේදිය යුතු සළු යුවලක්ය, මා හැඟි අත් පිස්නාය, නාගයන් විසින් ගෙනන ලද අංජනය, අරුණවන් මැටිය, අනෝතත්ත විලෙන් ගෙනා ජලයය, ගංගා නදියෙහි ජලයය, සක් ගෙඩිය, නන්ද්‍යාවර්තය, වර්ධමානකය, ක්ෂත්‍රීය කුමාරිකාවය,

රන් බඳුන් භාණ්ඩය, මා හැගි අරළු නෙල්ලිය, අමා ඔසුය, ලිහිණියන් විසින් ගෙනෙන ලද ඇල් හාල්ය (මහාවංසය 1950 11: 28,34) යනාදිය වේ.

### තෙල් ඔරුවෙහි සැතැප්වීම

ඇමතිවරු දශරථ රජුගේ මළ සිරුර තෙල් පිර වු දෙණක තබා චාරිත්‍ර පැවත්වා ඇත. මිහිඳු හිමියන්ගේ ශරීරය ද තෙල් පිරවු දෙණක බහා තැබු බව මහාවංසයේ සඳහන්වේ (මහාවංසය 1950 11: 22-23)

රාවණගේ නැගණිය වන ශුපර්ණකා සිය කැමැත්ත රාමට ප්‍රකාශ කරයි. ශුපර්ණකා විසින් රාවණගේ පියා විශ්‍රවස් බවත් ඇයගේ සොහොයුරන් ලෙස කුම්භකර්ණ, විභීෂණ, ඛර හා දූෂණ බව ත් ප්‍රකාශ කරයි (රාමායණ 1999: 416) රාම හා ලක්ෂමණ සුපර්ණකා ප්‍රතික්ෂේප කිරීම නිසා සුපර්ණකා සීතා වෙත කඩා පනී. ඒ අවස්ථාවේ දී ලක්ෂමණ කඩුව ගෙන සුපර්ණකාගේ දෙකණ හා නාසය කපා දමයි. සුපර්ණකාගේ සොහොයුරකු වන ඛර වෙත යන නැගණිය සිය කන් නාස කැපීම නිසා තමන් විරූපී කළ බව ප්‍රකාශකරයි (රාමායණ 1999: 418). ඈත අතීතයේ පැවති දඬුවම් ක්‍රමක් ලෙස කන් නාස කැපීම පෙන්වා දිය හැකිය. ඛර විසින් රකුසු නායකයන් 14 දෙනෙකු කැඳවා රාම සහ ලක්ෂමණ ඝාතනය කරන ලෙසත් ඔවුන්ගේ ලේ සුපර්ණකාට පානය කිරීමට සලස්වන ලෙසත් ප්‍රකාශ කරයි (රාමායණ 1999: 419). රාම හා ලක්ෂමණ රකුසන් 14 දෙනාව ඝාතනය කිරීම නිසා සුපර්ණකා නැවත තම සොහොයුරු වන ඛරගේ පා මුළ අඬාවැටේ (රාමායණ 1999: 421). රාම විසින් 1400 ක් රකුසන් ද ඛර හා දූෂණ යන නායකයන්ද මරා දමා තිබු නිසා රාවණ වෙත ගොස් ඒ බව ශුපර්ණකා ප්‍රකාශ කරයි (රාමායණ 1999: 442). සුපර්ණකා විසින් රාවණා නිහඬව සිටීම පිළිබඳව දොස් පැවරීම පිළිබඳව වේ (රාමායණ 1999: 443).

රාමායණයට අනුව රාවණගේ ප්‍රාසාදය රාක්ෂස කන්‍යාවන්ගෙන් හා බලහත්කාරයෙන් පැහැරගෙන එනුලැබුවා වු රාජ කන්‍යාවන්ගෙන්ද යුක්ත වු බව හනුමන් සිය දෙනෙත්වලින් දැක ගැනී. හනුමන් පුෂ්පක රථයට නැගි බවත් එහි පිළිවෙළ වී තිබු ආහාර පානවලින් සප්පායම් වු බවත් විස්තර වේ (රාමායණ 2000: 229).

### රාවණ

ඒකජටා නම් රකුසිය සීතා අමතා රාවණගේ පරම්පරාව පිළිබඳව දැක්වීම. මෙහිදී පුලස්තිගේ පුත්‍ර විශ්‍රවස් බවත් ඔහුගේ පුතා රාවණ බව දක්වයි (රාමායණ 2000: 258). රාවණගේ පුත්‍රයන් ලෙස අග්නිකේතු, දූර්ඝර්ෂ, රශ්මිකේතු, ඉන්ද්‍රජිත් දක්වා ඇත (රාමායණ 2000: 360).

### රාවණගේ රහස හෙළි කිරීම

රාවණ විසින් තමන් බොහෝ කාලයක් ආරක්ෂා කරන ලද රහසක් පාර්හව සෙන්පති හට හෙළි කරයි. එනම් දිනක් රාවණ පිතාමහගේ භවනයට යනවිට අහසෙහි පාවෙන ගිනිසිලුවක් වැනි වු අප්සරාවක් අල්ලාගෙන ඇය නිර්වස්ත්‍රකොට අනුභව කරන ලදි. කෙසේ හෝ මේ පිළිබඳව දැනගත්

පිතාමහ එයට දඩුවමක් ලබාදේ. එනම් යම්කිසි තැනැත්තියකුට බලහත්කාරකමක් කරතහොත් එදිනම රාවණගේ හිස සක්තකඩකට පැලීයන්නේය. එයින් භීතියට පත්වූ රාවණට සිය බලයෙන් සීතා සයනයට ගත නොහැකි විය (රාමායණ 2000: 367).

**විභීෂණ රාවණට සහය දැක්වීම**

විභීෂණ විසින් රාවණගේ සේනාව සියලු විස්තර රාමට ලබාදෙයි. මස්ලේ බුිදිනා කැමැති වෙස් ගතහැකි රාක්ෂසයෝ දශකෝටිදහසක් ලංකාවේ වෙසෙන බව ඔහු ප්‍රකාශ කරයි. ලංකාව ආක්‍රමණය කිරීමට තමන්ගේ සම්පූර්ණ සහය තමන් රාමට ලබාදෙන බව විභීෂණ ප්‍රකාශ කරයි. රාම ලක්ෂමණ අමතා මුහුදු ජලය ටිකක් ගෙන එන ලෙස දන්වා මුහුදු වතුර ගෙන ආ කල්හි විභීෂණ රාක්ෂයන්ගේ රජු හැටියට අභිෂේක කරයි. පාලමක් නොබැඳ ලංකාව ආක්‍රමණය කිරීමට නොහැකි බව විභීෂණ ප්‍රකාශ කළ අවස්ථාවේදී රාම විසින් එය ක්‍රියාවට නගන ලදි (රාමායණ 2000: 379). ශාර්දූල නම් රාක්ෂසයා ලංකාවට පැමිණ රාම විසින් ලංකාව ආක්‍රමණය කිරීමට සැරසෙන බව ප්‍රකාශ කරයි. රාවණ විසින් ශුක නම් වූ ඇමැතියා සුග්‍රීව වෙත දූතයකු ලෙස යවා රාමට උදව් නොකරන ලෙස ප්‍රකාශ කර සිටී. වඳුරන් ඔහුට පහර දී ඔහු වරපටවලින් ඔතයි. නමුත් අවසානයේදී රාම මොහු දූතයකු බවත් මොහු මැරීම යුක්තිසහගත නොවන බවත් ප්‍රකාශ කරයි (රාමායණ 2000: 381) රාවණගේ මුඛ්‍යතම සේනාපතීන්ගේ නම් මෙහි සඳහන් වන අතර මෙහිදී ඔවුන් සියලු දෙනාම ජීවිතක්ෂයට පත්වූ බව දක්වා ඇත. විභීෂණ වඳුරන් දිරිගන්වන ආකාරයද විභීෂණගේ අනුපමවූ සහාය අසන්නට ලැබීමෙන් මැති ඇමතිවරු හා රටවැසියන් මවිතයට පත්වූ බව මෙහි දක්වයි (රාමායණ 2001: 191).

ඉන්ද්‍රජිත්ගේ මායා බලය පිළිබඳව විභීෂණ හෙළිකරයි. නිකුම්භිල නමැති රකුසා අග්නිහෝමය පවත්වන චෛත්‍ය භූමිය වෙත ඉන්ද්‍රජිත් ගිය බවත් විධිමත් පරිදි හෝමය නිමකළ හොත් සටනකින් ඒ ඉන්ද්‍රජිත් පරාජය කල නොහැකි බවත් ඔහු යාගය නිම කිරීමට පෙර සේනාව රැගෙන යුද්ධයට පිවිසෙන ලෙසත් විභීෂණ ප්‍රකාශ කරයි (රාමායණ 2001: 109). විභීෂණ විසින් රාම ලක්ෂමණ දෙදෙනා රාවණ සමග සටන් කිරීම සඳහා උනන්දු කරවීම විස්තර කරයි (රාමායණ 2001: 110).

**රාවණගේ හමුදාව**

රාවණ බලසම්පන්න අශ්වයන් යෙදූ යුදරියට නැග, තූර්යවාදනයෙන් හා රණඝෝෂාවෙන් දිරිමත් කරනු ලබමින් සඞග්‍රාමාභිමුඛව පිටත්වූ ආකාරය මෙහිදී විස්තර කරයි. රාවණට අකම්පණ නම් වූ සේනාපතියෙක්ද, ධනුශිල්පයෙහි පාරප්‍රාප්තවූ අතිකාය නැමති සෙන්පතියා ද, මහෝදර නමැති රණශූරයා ද පිශාච නමින් හැඳින්වෙන අශනිවේශයෙන් පහරදෙන සෙබළා ද, මහා වෘෂභයෙකු අරා සිටින ත්‍රිශිරස් නැමති සෙන්පතියාද, නාග කොඩියක් ඔසවාගෙන සිටින කුම්භයා ද, ගිණිගෙන දිලිසෙන මුගුරක් ඔසොවාගෙන සිටින නිකුම්භගෙන් ද සමන්විත බව දක්වා ඇත (රාමායණ 2001: 41)

**කුම්භකර්ණ පිබිදීම**

උමා, රම්බා, නන්දීශ්වර, වරුණ කන්‍යා යන ඍෂිවරු මීට ඉහත රාවණ මිනිසකු අතින් මැරුම්කන බවට කරන ලද ප්‍රකාශන රාවණට මෙහිදී සිහිවේ. කුම්භකර්ණ වූ කලී මාස හතක් අටක් හෝ නවයක් නිදයි. මොහු අවදි කරවීමට රාක්ෂස සේනාවට මහත් වෙහෙසක් දැරීමට සිදුවේ. එ සඳහා රකුසෝ වාද්‍ය භාණ්ඩගෙන වයන්නට පටන්ගන්නා ලදි. අශ්වයන් ඔටුවන් බූරුවන් ඔහුගේ සිරුර මත ඇවිද්දවූහ. ඇතැමෙක් කෙස් උදුරන්නට වූහ. ඇතැමෙක් කන් විකූ බව සඳහන්වේ (රාමායණ 2001: 49). කුම්භකර්ණයා ගිල දැමූ ඇතැම් වඳුරෙක් නාස්පුඩු දෙකින් හා දෙකන් සිදුරෙන් පිටත පැමිණි බව මෙහි විස්තර වේ (රාමායණ 2001: 66).

**බෙහෙත් කන්ද ගෙන ඒම**

ජාම්බාවන් විසින් හනුමන්ට කෛලාස ගිරිශිඛරය හා කාඤ්චන පර්වත යන දෙක අතර දක්නට ලැබෙන ඖෂධී නම් පර්වතයෙන් ඖෂධ රැගෙන එන ලෙස ප්‍රකාශ කරයි. ඖෂධ කිහිපයක් සොයා ගැනීමට නොහැකි වූ හනුමන් කෝපයට පත්වී සානුවලින් නාගයන්ගෙන් සමාකීර්ණවූ පර්වතය දැතින්ගෙන පොඩි කොට සමස්ත පර්වතයම රැගෙන අහසට පැනනැංගේය. හනුමන් එම පර්වතය ගෙනවුත් වඳුරන් මැද හෙළීය. එයින් වහනය වූ ඖෂධ ගන්ධයෙන් දෙකුමරුවෝ පියෙවි සිහිය ලදහ. සියලු වඳුරන් සුවකරගැනීමෙන් පසු හනුමන් ඒ ඖෂධ පර්වතය පෙරළාගෙන ගොස් හිමවතෙහි තැබීය (රාමායණ 2001: 89).

**වෛශ්‍රවණ ලංකාවෙහි වාසයට පැමිණීම**

භාරද්වාජ සිය දියණිය විශ්‍රවාට විවාහ කර දෙයි. ඔවුන්ට වෛශ්‍රවණ යනුවෙන් පුතෙකු උපදී. වෛශ්‍රවණගේ ධ්‍යාන වැඩීම පිළිබඳව සතුටට පත්වන පිතාමහ ඔහුට වරයක් ඉල්ලන ලෙස ප්‍රකාශ කරයි. තමන් ලෝක පාලක පදවියකට හා ධන රක්ෂණයට කැමති බව වෛශ්‍රවණ ප්‍රකාශ කරයි. මේ අනුව පිතාමහ යම, ඉන්ද්‍ර හා වරුණ යන ලෝකපාලකයන් තිදෙනාගේ සතර වැන්නා හැටියටත්, නිධාන පාලනයද, පුෂ්පක නැමති දිව්‍යරථයද ඔහුට ප්‍රදානය කරයි. තම පියාවන විශ්‍රවාගේ උපදෙස් මත වෛශ්‍රවණ ලංකාවේ වාසයට පැමිණේ (රාමායණ 2001: 200).

**සතුන්ට වරදීම**

රාවණ ලොවපුරා සංචාරයකරන ගමනේදී දෙවියන් සමඟ යාගයක යෙදුණු මරුත්ත නම් රජු දක්නට ලැබිණ. සංවර්ත නම් බ්‍රාහ්මණයා මේ යාගය සිදුකළ අතර රාවණ දැකීමෙන් බියපත්වූ මොවුහු සතුන්ගේ වෙස් ගන්නා ලදි. ඉන්ද්‍ර මොනරෙකුගේද, යම කපුටෙකුගේද, ධනාධ්‍යක්ෂ (වෛශ්‍රවණ) කටුස්සෙකුගේ ද, වරුණ හංසයෙකුගේ ද, අනෙක් දෙවිවරුන් වෙනත් සතුන්ගේද වෙස් ගන්නා ලදි. රාවණ එහි සිටි සියලු ඍෂිවරුන් අනුභව කොට ඔවුන්ගේ රුධිරය පානය කළ අතර ඉන්ද්‍ර දෙවි තමන්ගේ වෙස් ගත් මොනරා අමතා ඔබට සර්පයන්ගෙන් බියක් නොපැමිණෙ ලෙසත් තමන්ගේ මේ නෙත් දහස ඔබගේ පියපත්වල පිහිටන ලෙසත් වැසි වසින කල ඔබට මහත් සතුටක්

අතිවේවා යැයි ද වරයක් ලබාදෙන ලදි. අතීත කාලයේදී මොනරුන්ගේ පිල් හුදෙක් නිල් පැහැගත් බවත් ඉන්ද්‍රගේ වරයෙන් පසු එහි නෙත් පිහිටි බවත් මෙහි විස්තර වේ. කාකවේශයෙන් සුරක්ෂිතවූ යම කපුටා අමතා මෙතැන් පටන් අනෙක් සතුන්ට ඇතිවන ලෙඩ රෝග ඔබට ඇති නොවන ලෙසත් මාරයාගෙන් බියක් නොපැමිණෙන ලෙසත් මිනිසුන් ඔබ නොමරණ බවත් ප්‍රකාශ කරන ලදි. වරුණ හංසයා අමතා පවිත්‍ර චන්ද්‍රයාගේ පෙණ පිඩුවලට සමාන සෞම්‍යවර්ණයක් ලබාදීමට වරයක් දෙයි. පෙර හංසයන්ගේ පියාපත් නිල්පාට වූ බවත් හිස මුදුන කොළපාට වූ බවත් මෙහි දක්වා ඇත. වෛශ්‍රවණ කටුස්සා අමතා රන්වන් පාටවන ලෙසට වරයක් ලබාදෙයි (රාමායණ 2001: 234)

### නලකූබරගේ ශාපය

රාවණ දිනක් කෛලාස මස්තකයට ගමන් ගත් අතර එහිදී වෛශෙවණගේ පුත්‍රයා වන නලකූබර ගේ  භාර්යාව වන රම්භා හමුවෙයි. රම්භා අල්වාගෙන බලහත්කාරයෙන් මෛථුනයෙහි යෙදීම නිසා කුපිතවන නලකූබර රාවණට ශාපකරයි. එම ශාපය නම් කිසිදු යුවතික් එම යුවතියගේ කැමැත්ත නැතිව ඇසුරු කළ නොහැකි බවටත් ඒසේ කළ හොත් ඒ අවස්ථාවේදීම හිස සත්කඩකට පැලී යන ලෙසත්‍ය. මෙයින් පිතාමහ ඇතුලු දෙවිවරු සතුටට පත්වූහ (රාමායණ 2001: 252)

### ඉන්ද්‍රගේ පරාජයට හේතුව

රාවණගේ පුත්‍රයා ඉන්ද්‍ර පරාජය කළ හේතුවෙන් බ්‍රහ්ම තෙමේ ඔහුව ඉන්ද්‍රජිත් ලෙස නම් කරන ලදි. ඉන්ද්‍ර මුදා හැරීම වෙනුවෙන් පිතාමහා රාවණට වරයක් ලබාදෙයි. එනම්  සංග්‍රාමාභිමුඛව සිටින හැම විටම අශ්වයන් යෙදූ යුධ  රියක් පහළ වන ලෙසටත් යාගයක් නිම කිරීමට පෙර යුධ පිණිස ගියහොත් එයින් තමන්ගේ විනාශය සිදුවන ලෙසටත්‍ය. ප්‍රජාපතී විසින් සකල විධ ජනයාගේ විශිෂ්ට අංග උපුටාගෙන ඒවා සංකලනය කිරීමෙන් අහල්‍යා නිර්මාණය කරන ලද බව මෙහි දැක්වේ. දිනක් ගෞතම ඍෂිවරයාගේ භාර්යාව වන අහල්‍යා සමඟ ඉන්ද්‍ර ඇති කරගත් සබඳතාවය නිසා ගෞතම ඍෂි ඉන්ද්‍රට ශාප කරයි. එම ශාපය නම් ඉන්ද්‍ර යම් කලෙක සටනට ගියහොත් සතුරන් අතට පත්වේවා යන්නයි. එසේම ගෞතම ඍෂි අහල්‍යාටද ශාප කරයි. එම ශාපය නම්  මෙතැන් සිට ඇය ලෝකයෙහි එකම රූපරාජිනිය නොවන බවටත් සියුල දෙනාටම රූප සම්පත්තිය සාධාරණ වන බවටත්‍ය. සමස්ත ලෝක වාසීන්ටම රූප සෞන්දර්යය පොදු වුයේ එතැන් සිටයැයි මෙහි විස්තරවේ (රාමායණ 2001: 262)

### රාවණා ඇදහු ආගම කුමක් ද

මේ සඳහා පිළිතුර රාමායණය තුලින්ම හමුවේ. රාවණ නර්මදා නදියෙහි දිය ස්නානය කොට ශිව ලිඞගය පුදා එය ඉදිරිපිට අත් ඔසොවා නැටු අයුරු රාමායණයෙහි විස්තර වේ (2001: 265) මේ අනුව ඔහු ශිව භක්තිකයෙකු බව පෙනේ.

**නිගමනය**

ඉතිහාසය හාදරන්නෙකුට රාමායණ කෘතිය ප්‍රාථමික මුලාශ්‍රයක් ලෙස පරිශීලනය කළ හැකිය. ඉන්දීය ඉතිහාසයේ දුර්වල පාර්ශවය ඉතිහාසය බවත්, ඇත්ත වශයෙන්ම එහි ඓතිහාසික සාහිත්‍යයක් නොමැති බවත් ඒ. ඒ. මැක්ඩොනල්ඩ් ප්‍රකාශ කොට ඇත්තේ (ගුණවර්ධන 2005: 139) ද රාමයාණයෙහි සඳහන්වනවා වැනි අභව්‍ය සිදුවීම් පදනම් කොටගෙන වන්නට ඇත. බැරැක්ලෝ නම් මහාචාර්යවරයා විසින් ඉතිහාසය කිසි සේත්ම කරුණු වාචක නොව පිළිගත් විනිශ්චය මාලාවකි යනුවෙන් ප්‍රකාශ කර ඇත (කා 1961: 54). ඉතිහාසඥයන්, රාමායණය ඉතිහාස කෘතියක් ගණයට ඇතුළත් කිරීමට මැලිකමක් දක්වන්නේ එය තුළ පිළිගත් විනිශ්චය මාලාවක් නොමැති හෙයින් යැයි හැගේ. නමුත්, මේ කථා පුවත් තුළ අන්තර්ගත ඓතිහාසික මුල බිජයන් කවරේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත්වේ.

**ප්‍රාථමික මුලාශ්‍රය**


- **ජානකීහරණය** 1969, චාල්ස් කොගඩකුඹුරේ, කොළඹ.
- **රාමායණ** 1999ල I කාණ්ඩය, පී. එස්. බී. සේනානායක, ගොඩගේ මුද්‍රණාලය, මරදාන.
- **රාමායණ** 2000, I I කාණ්ඩය, පී. එස්. බී. සේනානායක, ගොඩගේ මුද්‍රණාලය, මරදාන.
- **රාමායණ** 2001, I I I කාණ්ඩය, පී. එස්. බී. සේනානායක, ගොඩගේ මුද්‍රණාලය, මරදාන.
- **රාමායණ** 1994, සුනිල් ආරියරත්න, ගොඩගේ මුද්‍රණාලය, මරදාන.
- **The Janakiharana of Kumaradsa** 1967, S. Paranavitana, Government Press Ceylon.
- **The Lankavatara Sutra** 1966, Suzuki Teitaro Daisetz, Routledge London.
- **Mahavamsa** 1989 Ananda Guruge, Associated news papers of Ceylon Limited, Lake House Colombo.
- **Mahāvaṃsa part I & II** 1967 (trans.), Sumangala Tera and Devarakshitha Batuwanthudāwe.,
- Rathanākara bookshop, Wella Avenue, Colombo.
- **The Mahāvaṃsa or the Great Chronicle of Ceylon** 1950 W. Geiger., Ceylon Government Information
- Department, Colombo.
- **Pansiyapanas Jathaka** 2003, Buddhist Cultural Center, Dehiwala.

**ද්විතීයික මූලාශ්‍රය**


- අමරවංශ හිමි කොත්මලේ 2014, **ලක්දිව සෙල්ලිපි**, එස්. ගොඩගේ සමාගම, මරදාන
- අමරසිංහ මාලිංග 2005, **සීගිරිය ලෝක උරුමයක වගතුග**, දායාවංශ ජයකොඩි සහ සමාගම
- කීර්ති කේ 1955, **සීතාහරණය**, කොළඹ
- ගුණවර්ධන රණවීර ලෙස්ලි 2005, ‍ කල්හණගේ රාජතරංඞගණිය හා භාරතීය ඓතිහාසික සම්ප්‍රදායය,, **ඉතිහාසයේ අතීතය**, සංස්ඩ ලෙස්ලි ගුණවර්ධන, පියසිරි මුද්‍රණ ශිල්පියෝ, නුගේගොඩ.
- ගුණසේකර සුරිය 2007, **ලංකා ඉතිහාසයේ හෙළ යුගය**, පන්නිපිටිය.
- ජයරාජන් පෝල්. එම්. 1983, **සිංහල අකාරාදියේ පරිණාමය පිළිබඳ ඉතිහාසය**, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- බණ්ඩාර ප්‍රියදර්ශන 2012, ‍ ථෙරවාදී බුදුසමය හා ලාංකේය ඉතිහාසකරණය (මහාවසංය ඇසුරින් කෙරෙන අධ්‍යයනයකි), **සමාජ විමර්ශන**, සංස්ඩ ඒ. ඒච්. එම්. එච්. අබයරත්න, පළමුවන කලාපය, සමාජීයවිද්‍යාපීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
- බස්නායක එච්. ටී. 2004, **පුරාතන ඉන්දිය ශිෂ්ටාචාරය**, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ
- බෂාම් ඒ. එල්. 1995 **අසිරිමත් ඉන්දියාව**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- සෙනෙවිරත්න නාගොඩ ආරියදාස 2003, **ශ්‍රී ලංකා රාවණ රාජධානිය සහ සීගිරි පුරාණය,** විස්තාරිත ද්විතීය මුද්‍රණය
- Brohier R.L. 1935, **Ancient Irrigation work in Ceylon**, The Ceylon Government press, Colombo.
- Gurge Ananda 1991, **The Society of the Ramayana**, Abhinav Publications, India.